**උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (එන්ඊඑල්එස්අයිපී ) - 2013**

---

උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ( එන්ඊඑල්එස්අයිපී ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ( ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ( ජාසංසං ) අතර 2009 නොවැම්බර් 08 දින එළඹි අංක 4728- එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II ආ වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව , ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු සහ නැගෙනහිර පළාත් සභාවල පළාත් පාලන කොමසාරිස්වරුන් පළාත් මට්ටමින් ව්‍යාපෘති කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා වගකිව යුතු වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රතිචාර දක්වන හා වගකිව යුතු ආකාරයකින් සේවා හා පළාත් යටිතල පහසුකම් බෙදාහැරීම සඳහා උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවලට සහාය වීමයි. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව , ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 86 ක් වන අතර එයින් එ.ජ.ඩො. මිලියන 50 ක් එනම් සියයට 58 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. එජඩො මිලියන 34 ක් වන ඉතිරි ව්‍යාපෘති පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් සැපයිය යුතු අතර ඉතිරි කොටස වන එජඩො මිලියන 2 සඳහා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් දායක වනු ඇත. 2010 මැයි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 ව්‍යාපෘතියේ කාර්යයන්

---

ගිවිසුමට අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක 5 කින් සමන්විත වේ. එනම් සංරචක 1,2,3,4 සහ 5 වශයෙනි. ව්‍යාපෘතියේ එම සංරචක 5 ට අදාල කාර්යයන් සාරාංශ කර පහත දැක්වේ.

**1 සංරචකය - යටිතලසේවා බෙදාහැරීම්**

-----------------------------

පළාත් පාලන ආයතනවලට ඔවුන්ගේ යටිතල සංවර්ධන කාර්යයන් සිදුකිරීමට හැකි වන ලෙස ආධාර සැපයීම

**2 සංරචකය - ගණන්දීමේ වගකීම් ආයතනගත කිරීම**

-----------------------------------------

පාරදෘශ්‍ය හා ස්වාධීන වාර්ෂික මූල්‍ය විගණනය, සමාජ හා කාර්මික විගණනය සිදුකිරීමට සහ හිඟ මූල්‍ය ප්‍රකාශන හා විගණන විමසීම් සමඟ කටයුතු කිරීමට හැකි වන පරිදි පළාත් පාලන ආයතනවලට කාර්මික සහාය සැපයීම. පළාත් පාලන ආයතනවල මෙහෙයුම් ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන හා සන්නිවේදන ව්‍යාපාර හා පද්ධති සහ අදියරයන් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම.

**3 සංරචකය - ධාරිතා වර්ධනය**

-------------------

සැලසුම් කිරීම , අයවැයකරණය , මූල්‍ය කළමනාකරණය , ප්‍රසම්පාදනය හා ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පළාත් පාලන ආයතනවල ධාරිතාවය ඉහළ නැංවීම හා කාර්යක්ෂම හා කාලීන ආකාරයෙන් විගණනයන් සිදුකිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක වල හැකියාවන් ශක්තිමත් කිරීම.

4 සංරචකය - **තක්සේරු කිරීම හා ඇගයීම**

------------------------------

පළාත් පාලන ආයතනවල කාර්යයන් නියාමනය කිරීම සඳහා විස්තීර්ණ පද්ධතියක් ස්ථාපනය කිරීම හා පළාත් පාලන ආයතන වල මෙහෙයුම් පිළිබඳව ඇගයීම් හා විශ්ලේෂණ සිදුකිරීම

5 සංරචකය - **ව්‍යාපෘති කළමනාකරණය**

-------------------------------

ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල ධාරිතාවය ශක්තිමත් කිරීම

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් වේ.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මුල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය , ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මුල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම පදනම් කර ගෙන මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ ( ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ , ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපුර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) මුල්‍ය ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතින්වලට අනුකූල වුයේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ ( ඩොලර් ) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පුර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මුල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපුර්ණයන් සඳහා වු ඉල්ලුම්පත්‍ර සනාථ කිරිම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතින්වලට අනුකූල වී ඇති බවත්ය.

**4. මුල්‍ය ප්‍රකාශන**

**----------------**

4.1 මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වු තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.2,697,298,747 ක් වු අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.6,313,681,328 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම හා

ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| 1 - සංරචකය | | | |
| පළාත් පාලන ආයතන වලට මුදා හරින ලද සමූහ ප්‍රදාන | 2,074,525,021 | 1,179,150,104 | 5,512,060,021 |
| 2 - සංරචකය | | | |
| ගණන්දීමේ වගකීම් ආයතනගත කිරීම | 4,517,954 | 2,662,087 | 8,390,647 |
| 3- සංරචකය | | | |
| ධාරිතා වර්ධනය | 568,937,604 | 55,642,229 | 644,778,760 |
| 4 - සංරචකය | | | |
| තක්සේරු කිරීම් හා ඇගයීම් | 1,081,770 | 4,806,481 | 7,628,064 |
| 5 - සංරචකය | | | |
| ව්‍යාපෘති කළමනාකරණය | 48,236,398 | 55,425,611 | 140,823,836 |
| | 2,697,298,747 | 1,297,686,512 | 6,313,681,328 |

## 4.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ(ඩොලර්) ගිණුමේ මෙහෙයුම් හා එදිනට ගිණුමේ පැවති ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 14,280,646 | 1,815,938,425 |
| එකතු කළා : ඌනපූරණයන් | 4,085,080 | 535,767,203 |
| විදේශ විනිමය වාසිය | - | 43,828,933 |
| | ------------- | ----------------- |
| | 18,365,726 | 2,395,534,561 |
| අඩුකළා : ආපසු ගැනීම් | 14,689,406 | 1,914,844,624 |
| | ------------- | ----------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 3,676,320 | 480,689,937 |

**5. විගණන නිරීක්ෂණ**

---------------------

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ උද්ගත වු රු.මිලියන 43.83 ක විදේශ විනිමය ලාභය මුල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවලට මුදාහරින ලද ප්‍රදාන සමාලෝචිත වර්ෂය තුළ අදාළ පළාත් පාලන ආයතන විසින් සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණද, යටිතල සංවර්ධන කටයතු සඳහා මුදාහරින ලද රු.මිලියන 27.88 ක් වු එම ප්‍රදාන මුල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හෙළිදරව් කර තිබුණි.

**5.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ 1 වගන්තිය බී 4 හි දක්වා ඇති පරිදි ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික අයවැය ලේඛනයක් මුදල් වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XV පරිච්ඡේදය ප්‍රකාරව මසකට රු.50,000 කට වැඩි වැටුප් හා දීමනා ගෙවීම් ලබන නිලධාරින්ගෙන් අයකළ යුතු උපයන විට ගෙවීම් බදු, නැගෙනහිර පළාතේ ව්‍යාපෘති කාර්යාලය විසින් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සිවිල් වැඩ හා රු.මිලියන 512.49 ක මුදලකට මිලදී ගත් භාණ්ඩ වලට අදාළව 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර එකතු කළ අගය මත බදු විස්තර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

විදේශීය හා දේශීය සංරචක යටතේ වෙන්කිරීම් පිළිබඳ විස්තර රජයේ වාර්ෂික ඇස්තමේන්තුවල සලසන ලද ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුමේ වෙන් කරන ලද මුදල | | 2013 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු වල ප්‍රතිපාදනය | උපයෝජනය කළ මුදල | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තථ්‍ය වියදම සමාලෝචිත වර්ෂය තුළ | | 2013 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන. | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසං.සං | 50 | 5,500 | 1,960 | 17.7 | 1,953.63 | 41.62 | 4,578.48 |
| ශ්‍රීලංර | 34 | 3,740 | 490 | 4.4 | 484.94 | 13.42 | 1,476.46 |
| ප්‍රතිලාභින් | 02 | 220 | - | 0.91 | 100.49 | 1.92 | 211.53 |
| එකතුව | 86 | 9,460 | 2,450 | 23.01 | 2,539.06 | 56.96 | 6.266.47 |

තවදුටරත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ප්‍රතිපාදනය කරන ලද අරමුදල් භාවිතා කරමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සමස්ත ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව වගකීම් දක්වමින් මූල්‍ය හා භෞතික ඉලක්කයන් සහිතව ව්‍යාපෘති සංරචකයන් හා අරමුදල් ප්‍රතිපාදනය ආවරණය කරමින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ව්‍යාපෘති යෝජනාව අනුව, කාර්යයන් පහක් වෙනුවෙන් ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 2,846 ක මුදලක් අයවැයගත කර තිබුණද සමාලෝචිත වර්ෂ තුනක කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 2,696 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 65 ක් ඉකුත්වී තිබුණද, ඉතිරි ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 5 ක් පමණක් උපයෝජනය නොකර පැවතුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 27.88 ක් වූ අග්‍රිම ශේෂ සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව උතුරු පළාතේ පළාත් පාලන ආයතනවල පැවතුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද එම අග්‍රිම ශේෂ ව්‍යාපෘති වියදම් ලෙස සලකා තිබූ අතර, එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති පිරිවැය වැඩියෙන් දක්වා තිබුණි.

(iv) තවද , සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 190.10 ක පිරිවැයකට මිලදී ගෙන පළාත් පාලන ආයතනවලට හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට භාරදී තිබූ ඉදිකිරීම් උපකරණ ඵලදායිව උපයෝජනය කළ බව තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතනවලට භාරදෙන ලද රු.මිලියන 3.32 ක් වටිනාකම වූ පරිගණක මෘදුකාංග කිසිදු පළාත් පාලන ආයතනයක් විසින් අරමුණු කළ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණු බැවින් ඒ සඳහා දරන ලද පිරිවැය නිශ්ඵල වී තිබුණි.

**6.2 භෞතික කාර්ය සාධනය**

---------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය විවිධ අංශයන් යටතේ පහත දැක්වේ.

| අංශයන් | භෞතික | | | මූල්‍ය | | |
|---|---|---|---|---|---|---|
| | 2013 වර්ෂය සඳහා ඉලක්කය | 2013 දෙසැ. 31 දිනට ප්‍රගතිය | නිම කිරීමේ ප්‍රතිශතය | 2013 වර්ෂය සඳහා ඉලක්කය | 2013 දෙසැ. 31 දිනට වියදම | ප්‍රගතිය |
| | කි.මී/ සංඛ්‍යාව | කි.මී/ සංඛ්‍යාව | % | රු.මිලියන | රු.මිලියන | % |
| ප්‍රවේශ මාර්ග | 643.724 | 503.838 | 78 | 6,221.386 | 4,086.772 | 65.7 |
| වෙළඳපොළවල්, උද්‍යාන හා කුඩා නගර ප්‍රදේශ | 172 | 74 | 43 | 2,134.748 | 810.931 | 38 |
| මලාපවහන / ජලාපවහන | 38.454 | 32.664 | 85 | 514.049 | 338.859 | 65.9 |
| අප ද්‍රව්‍ය අපහරණ පද්ධති | 1 | 1 | 100 | 3.019 | 1.449 | 48 |
| ග්‍රාමීය ජල සැපයුම් යෝජනා ක්‍රම | 7 | 5 | 71 | 95.870 | 19.745 | 21 |
| ග්‍රාමීය විදුලි සැපයුම | 21.3 | 16.3 | 77 | 28.186 | 16.189 | 57 |

ඉහත වගුවට අනුව, වෙළඳපොළවල්, උද්‍යාන හා නගර ප්‍රදේශ පිළිබඳ සංවර්ධන කාර්යයන්හි වාර්තාවූ ප්‍රගතිය ඉලක්කයන්ට වඩා පිටු පසින් විය. ගොඩනැඟිලි හා මාර්ග ඉදිකිරීම් වැඩ බිම් කිහිපයක් පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂණයන් මත නිරීක්ෂණයන් සාරාංශ කර පහත විස්තර කෙරේ.

(අ) කිලිනොච්චි මාළු වෙළඳපොළ, මන්නාරම ළමා උද්‍යාන හා ඔඞ්ඩුසුඩාන්හි සත්ව ඝාතකාගාරය සඳහා ඉදිකරන ලද ගොඩනැඟිලි මාස 6 සිට 18 දක්වා කාලයක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) බ්‍රේන්තුරෙයිච්චේනයි හි ජලාපවහනයක මතුපිට කොන්ක්‍රීට් කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂගේ අනුමැතිය නොමැතිව ජලපවහනය ඉදිකිරීම සඳහා යොදා ගත් TOR වානේ කම්බි කිලෝ ග්‍රෑම් 5,540 ක් සැපයීම සඳහා විචලනයක් ලෙස රු.මිලියන 1.06 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන කමිටුවේ කමිටු සටහන් හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ ටෙන්ඩර් ඇගයීම් ලියකියවිලි ආදී ලිඛිත සාක්ෂි නොවීම හේතුවෙන් රු.මිලියන 30.80 ක පිරිවැයකට ප්‍රදානය කරන ලද කාන්තන්කුඩි නගර සභාව සඳහා මහල් තුනක ගොඩනැඟිල්ල ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්තුවේ ලංසු ක්‍රියාවලිය සතුටුදායක ලෙස ඇගයීම් කළ නොහැකි විය. තවද මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය සභාව සඳහා කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.1,403,750 කට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව සඳහා යොදාගත් ලංසු ඇගයීම් ක්‍රියාවලිය, තෝරාගත් ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද ලංසු මිල පිළිබඳව පසුව කරන ලද වෙනස් කිරීම් හේතුවෙන් සැකසහිත බවට පත්ව තිබුණි.

(ඈ) නයිපවුල්තොට්ටම්හි මාර්ගය මතුපිට කොන්ක්‍රීට් ඇතිකිරීම හා සරුක්කායිහි පාසැල් මාර්ගය මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම සඳහා කොන්ත්‍රාත්තුව යටතේ වැඩ ආරම්භ කර නොතිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුම 2012 මැයි මාසයේදී අවසන් කර තිබුණි. බැඳුම්කරයේ අදාළ වලංගු කාලය ඉකුත්වී තිබු හෙයින් පිළිවෙලින් රු.මිලියන 2.37 ක් හා රු.මිලියන 1.37 ක් වු වැඩ පූර්ව අත්තිකාරම් ආපසු අයකර ගත නොහැකිව තිබුණි.

(ඉ) පොයින්ට් පේද්‍රු නගර සභාව හා කයිට්ස්, කරෙයිනගර්, නල්ලූර්, වඩමාරච්චි නිරිත, නානට්ටාන්, මන්නාරම, මන්තායි බටහිර, මුසලී , තුනුක්කායි, මරිටයිම්පත්තු, පුතුකුඩිඉරිප්පු, කරච්චි හා පූනාකරි ප්‍රාදේශීය සභා විසින් කිලෝමීටර් 107.18 ක් වු මාර්ග පුනරුත්ථාපන වැඩ හා ගොඩනැඟිලි ඉදිකිරීම් කර තිබුණි.

මෙම කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් නිරීක්ෂණය වු පොදු දුර්වලතා පහත දැක්වේ.

- ★ මාර්ග වැඩ කිහිපයක් සඳහා මී මී 100 හා මීමී 20 ප්‍රමාණයේ කළු ගල් සම්පූර්ණයෙන් යොදා නොතිබුණි.
- ★ උරහිස් පිරවීම් අවිධිමත් තද කිරීම් සහිතව සිදුකර තිබුණි.
- ★ පිරිවිතරවල දැක්වෙන ප්‍රමාණයට අඩු පළලකින් මාර්ග ඉදිකර තිබුණි
- ★ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.9.1 වගන්තියට පටහැනිව සමහර වැඩ ප්‍රජා මධ්‍යස්ථාන වලට ප්‍රදානය කර තිබුණි.
- ★ මාර්ග වැඩ සඳහා මට්ටම් කිරීමේ උපකරණ යොදා ගෙන නොතිබුණි.
- ★ සමහර ප්‍රාදේශීය සභාවල මාර්ගවල කොටස් විශාල ලෙස හානිවී තිබුණි.

★ සමහර මාර්ග පිළිබඳ කොන්ත්‍රාත්කරුවන් විසින් තත්ත්ව පරීක්ෂණ සිදුකර නොතිබුණි.

★ බෝක්කු උරහිස් පිරවීම් වැඩ විධිමත්ව සිදුකර නොතිබුණි.

★ අපේක්ෂිත වටිනාකමට මහජන සහභාගිත්වය සිදුකර නොතිබුණි.

★ සමහර කොන්ක්‍රීට් මාර්ග සඳහා ජලය දැමීම කර නොතිබුණි.

★ සමහර ගොඩනැඟිලිවල පිපිරීම් නිරීක්ෂණය විය.

★ තාර විධිමත්ව මිශ්‍ර කර නොතිබුණි.

★ බොහෝ මාර්ග වැඩ වලට ව්‍යාපෘති නාම පුවරු සවිකර නොතිබුණි.

★ ඉදිකිරීම සම්පූර්ණ කිරීමෙන් තොරව සමහර කොන්ත්‍රාත් වැඩ නතර කර තිබුණි.

★ මාර්ග වැනලයන් (Channel) විධිමත්ව ඉදිකර නොතිබුණි.

(ඊ) මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලන කාර්යයන්හි අභ්‍යන්තර විගණනය සඳහා උපදේශක සේවා වෙනුවෙන් පුද්ගලික විගණන සමාගමක් සමඟ රු.මිලියන 4.63 ක වටිනාකමට කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණු අතර ඉන් රු.මිලියන 1.09 ක් මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි. කෙසේ වුවද පළාත් පාලන ආයතනවල මූල්‍ය විගණනය සඳහා ප්‍රතිපාදන කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් කර නොතිබුණි. තවද යොමු ගත කොන්දේසිවල දක්වා තිබූ වැඩ විෂය පථයන්හි ඇතුළත් කරන ලද විෂයයන් 31 කින් විෂයයන් 13 ක් උපදේශක විසින් ආවරණය කර නොතිබුණි. තවද සමහර වැඩ විෂය පථයන් සම්පූර්ණයෙන්ම ආවරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. මූල්‍ය කළමනාකරණ විගණනය, ප්‍රසම්පාදන විගණනය හා කාර්මික විගණනය යටතේ කාර්යයන් සිදුකර නොතිබූ අතර ඒ පිළිබඳ වෘත්තීය මතයක් සහිත වෙනම වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි.

## 6.3 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාතේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 237 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද එම ඉදිකිරීම් වැඩ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) නම් ව වූ වෙනත් විදේශ මූල්‍යයන ව්‍යාපෘතියක් යටතේ සිදුකිරීමට සැලසුම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා එකතු කළ අගය මත බදු ලියාපදිංචිය පිළිබඳ වලංගු භාවය පරික්ෂා කිරිමෙන් තොරව සිවිල් වැඩවල යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්ට උතුරු පළාතේ එක් නගර සභාවක් හා ප්‍රාදේශීය සභා 7 ක් විසින් අවස්ථා 16 කදී එකතුව රු.මිලියන 12.3 ක එකතු කළ අගය මත බදු ගෙවීම් සිදුකර තිබු බව නිරික්ෂණය විය. තවද එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකයන් ඉදිරිපත් නොකරන ලද කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රාදේශීය සභා 02 ක් විසින් අවස්ථා 3 කදී එකතුව රු.මිලියන 3.924 ක එකතු කළ අගය මත බදු ගෙවීම් සිදුකර තිබු බව විගණනයේදී නිරික්ෂණය විය.

**7. පද්ධති හා පාලන**

**-----------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) මූල්‍ය කළමනාකරණය